# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2476/41 - 2026 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා - 2026.02.20**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ)වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ අංක 03 දුටුවැව කොට්ඨාසයට තේරී පත්වූ සෝමසිරිගේ ජයනාත් සඳනුවන් රාජපක්ෂ අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූද, එම ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ අංක 03 දුටුවැව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා බ්‍රාහ්මන මුදියන්සේලාගේ ධනෝජා කුමාරි තිලකරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි නුවර පක්ෂගේ පිවිතුරු ඉන්දික රවිරාජ් ගුණරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් බ්‍රාහ්මන මුදියන්සේලාගේ ධනෝජා කුමාරි තිලකරත්න, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභවේ අංක 03 දුටුවැව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එන්.පී.පී.අයි.ආර්.ගුණරත්න,**
තේරීම්භාර නිලධාරි,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි මස 19 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

EOG 02 - 0171

1A - PG 7536 — 08 (2026/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*